# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන)

**1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 2019 අප්‍රේල් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 සැප්තැම්බර් මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[276 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ පාරිසරික ආරක්ෂක පියවර ඇතුළත් කිරීමෙන් මණ්ඩලයේ කර්තව්‍ය පුළුල් කිරීම සහ පර්යේෂණ ප්‍රතිඵල බෙදහරිනු ලැබිය යුත්තේ කවරකට ද යන්න නිශ්චිතව දක්වාලීම ද වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ මෙම නීතිය සහ වෙනත් අදාළ නීති අතර ඇති අනනුකූලතාව නිවැරදි කිරීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ මණ්ඩලයේ සංයුතිය ප්‍රතිව්‍යුහගත කිරීම වේ.

# තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන)

එල්.ඩී.—ඕ. 22/2014

## 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක      දරන තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1993 අංක 52 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 5 වන වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(අ) තේ වගාවට හානිකර රෝග හා පළිබෝධ වැළැක්වීම සහ පාලනය කිරීම, තේ ඉඩම්වල පස සංරක්ෂණය කිරීම, භාවිත කරනු ලබන පොහොරවල ගුණාත්මක බව, තේ රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මක බව පවත්වා ගැනීම, දේශගුණ විපර්යාසවල බලපෑම ඇගැයීම සහ ඒ පිළිබඳ කටයුතු කිරීම සහ තේ නිෂ්පාදන විවිධාංගකරණය ඇතුළුව තේ වගා කිරීම සහ නිෂ්පාදනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ හා විමර්ශන පැවැත්වීම, ඒ සඳහා සහාය වීම සහ උනන්දු කරවීම; සහ එම පර්යේෂණවල ප්‍රතිඵල ස්වකීය අභිමතය පරිදි, 1975 අංක 35 දරන ජාතික රාජ්‍ය සභාවේ කුඩා තේ වතු සංවර්ධන පනත මඟින් ස්ථාපිත කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට, කුඩා තේ වතු හිමියන්ට, මහා පරිමාණ වතු ක්ෂේත්‍රයට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට ප්‍රචාරය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම;”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඔ) (i) 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරනු ලබන ශාක ආනයන බලපත්‍රයක අධිකාරය යටතේ මිස, යම් තේ රෝපණ ද්‍රව්‍යයක් ආනයනය කිරීම වැළැක්වීම සහ අපනයනය සම්බන්ධයෙන් වන විට, අපනයනය කරනු ලබන රටෙහි ඉල්ලීම අනුව ශාක ස්වස්ථතා සහතිකයක් නිකුත් කිරීම;

(ii) මේ ඡේදයේ කාර්යය සඳහා "තේ රෝපණ ද්‍රව්‍ය" යන්නට ප්‍රරෝහක ලෙස ඍජුවම භාවිත කළ හැකි රිකිලි, අතු, අනුජයන්, කඳන්, බීජ හෝ පටක රෝපිත ශාක කොටස් (ක්ෂුද්‍ර ප්‍රරෝහක) ඇතුළුව ඕනෑම ආකාරයක රෝපණය කිරීමේ ද්‍රව්‍යයක් හෝ වක්‍ර ලෙස ශාක බවට ප්‍රතිජනනය කර ගත හැකි යම් තේ ශාකයක සජීවී කොටසකින් ලබා ගන්නා ඕනෑම ආකාරයක දෛහික හෝ ප්‍රජනක පටක, අවයව මෙන්ම ජාන ජ්ලාස්ම, වැඩිදියුණු කළ ප්‍රභේද, වගාවන් සහ තේ වල වල් දර්ශ ද ඇතුළු ඕනෑම ආකාරයක රෝපණය කිරීමේ ද්‍රව්‍යයක් ද ඇතුළත් වේ;"; සහ

(2) එම වගන්තියේ (ඔ), (ඕ), (ක), (ග) සහ (ච) ඡේද එම වගන්තියේ (ඕ), (ක), (ග), (ච) සහ (ජ) ඡේද වශයෙන් නැවත අංක යෙදීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන නම්කළ සාමාජිකයන්, එනම් -

(i) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයකු;

(ii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ තනතුරට අඩු නොවන තනතුරක නියෝජිතයකු;

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මඟින් පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නම් කරනු ලබන එම මණ්ඩලයේ නියෝජිතයකු;

(iv) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත මඟින් පිහිටුවනු ලැබූ, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් නම් කරනු ලබන එම අධිකාරියේ නියෝජිතයකු;

(v) කෘෂිකර්ම අංශයේ පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ පළපුරුද්දක් සහිත තැනැත්තන් අතරින් වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

(vi) (291 වන අධිකාරය වූ) ලංකා වැවිලිකරුවන්ගේ සංගමය ආඥාපනත මඟින් පිහිටුවනු ලැබූ, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයකු;

(vii) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නිර්ණායක මත තෝරාගනු ලැබිය යුතු, වෘත්තීය සමිති නියෝජනය කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

මෙම අනුඡේදයේ කාර්යය සඳහා, "වෘත්තීය සමිතිය" යන්නට (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥාපනතේ එයට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

(viii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය විසින් නම් කරනු ලබන එම සම්මේලනයේ නියෝජිතයකු;

(ix) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තශාලා අයිතිකරුවන්ගේ සංවිධානය විසින් නම් කරනු ලබන, එම සංවිධානයේ නියෝජිතයකු.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.